# 4 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 04

## L2, S2, R2, W2

## නිපුණතා ආවරණය - 2021



- සරල ඡේදයක් නිවැරදි ව උච්චාරණයෙන් යුතු ව කියවයි.
- සරල ඡේදයකට සවන් දී අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
- නිශ්ශබ්ද සරල ගීතයකට සවන් දී අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)

## $L_2$ $S_2$ $R_2$ $W_2$ ඉගෙනුම් පල

- සරල ඡේදයක් නිවැරදි ව උච්චාරණයෙන් යුතු ව කියවයි.
- සරල ඡේදයකට සවන් දී අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
- සරල ගීතයකට සවන් දී අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**සරල ඡේදයකට සවන් දී ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.**

- ඡේද හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

අප රිංගු ගඟ අද්දර කැලේ එක පැත්තක අහස අල්ලන්ට මෙන් ඉහළ නඟින්නේ කඳු ගැටයක් නිසා ය. ඒ කඳු ගැටය මුදුනේ දුවැන්ත කළු ගලක් ඇත. එය අපේ ගම දෙස බලා සිටින අද්භූත මිනිසකු වැන්න. කුඩා කල මේ ගල් පර්වතය අප සිත බියෙන් තැති ගැන්වීය. හැන්දෑවට මේ ගල මුදුනට මලානික අව් රැල්ලක් වැටෙයි. එය රාස්සිගේ අව්ව යයි වැඩිහිටියෝ කිහ. රාස්සි ඒ ගල මත්තෙහි වී වනා වේළන්නේ ඒ වෙලාවට යයි ඔවුහු අපට කියා දුන්හ. ඒ නිසා අප කඳු මුදුන දෙස වැඩිපුර බැලුවේ නැත. වැරදිලාවත් බැලුවේ නම් අප තුළ ඇති වූයේ රාස්සිය දුටුවා හා සමාන තැති ගැන්මකි.

ගඟ අද්දර කැලේ

සෝමවීර සේනානායක

1. කඳුගැටය මුදුනේ තිබෙන්නේ කුමක් ද ?

..............................................................................................................................................................

2. හැන්දෑවට ගල මුදුනට වැටෙන අව්රැල්ල වැඩිහිටියන් හඳුන්වන්නේ කුමන නමකින් ද ?

..............................................................................................................................................................

3. කඳුගැටය මුදුනේ ඇති කළුගල පෙනෙන්නේ කුමන ආකාරයෙන් ද ?

..............................................................................................................................................................

4. ගල මුදුනට මලානික අව්රැල්ලක් වැටෙන්නේ කුමන වේලාවට ද ?

..............................................................................................................................................................

5. මලානික අව්රැල්ල වැඩිහිටියන් හඳුන්වන්නේ කුමන නමකින් ද ?

..............................................................................................................................................................

6. කඳු මුදුන දෙස බැලූ විට තැති ගැන්මක් ඇතිවන්නේ ඇයි ?

..............................................................................................................................................................

අප ගෙනා කෑම ඉවර වන්නට ළං වූයෙන් අපි පසු දා ඔරුව බාගෙන එගොඩට යාත්‍රා කළෙමු. අප විසින් වේලන ලද අඹවලින් ද එකතු කරන ලද කජු ඇටවලින් ද කොටස බැගින් අපි පොඩි ගමරාලට දුන්නෙමු. ඔහු ගත්තේ වියළි අඹ ටිකක් පමණි. අනික් අඹත්, කජුත් කඩපළට ගෙන ගොස් විකුණා හාල් හා මිරිස් ලුණු ආදිය ගත්තෙමු. මා තන්ගුස් දෙපටක් ද අස්ව කෙඳි ටිකක් හා බිළී කටු ද මිලට ගත්තේ මාළු බානු පිණිස ය. අපි පොඩි ගමරාලගේ ගෙදරින් දවල් බත් කා හවස් වරුවේ යළිත් මඩොල් දූව බලා යාත්‍රා කළෙමු.

මඩොල් දූව

මාර්ටින් වික්‍රමසිංහ

1. ඔරුව බාගෙන එගොඩට යාත්‍රා කළේ ඇයි ?

.....................................................................................................................................

2. පොඩි ගමරාලට දුන්නේ මොනවා ද ?

.....................................................................................................................................

4. ඡේදයට අනුව පහත වාක්‍ය අනුපිළිවෙළට සකස් කර අංක යොදන්න.

01. ඉතුරු අඹත් කජුත් කඩපොළට ගොස් විකුණුවෙමු. ..................

02. දවල් කෑම කා මඩොල් දූව බලා ගියෙමු. ..................

03. වේළන ලද අඹ සහ කජු ඇට පොඩි ගමරාලට දුන්නෙමු. ..................

04. හාල්, මිරිස් හා ලූණු ද ගත්තෙමු. ..................

05. ගෙන ආ කෑම අවසන් වන්නට පෙර ඔරුව රුගෙන එගොඩට ගියෙමු. ..................

> රූකඩ කපන්නාගේ කම්මල වූ කලි කාමරයකින් ද ඉස්තෝප්පුවකින් ද යුතු, මැටි ගසා අතු සෙවෙණි කළ පැල්පතකි. කපා නිම කළ, නොකළ රූකඩින් ද, සායම් ගා වේළීමට තැබූ විචිත්‍ර වර්ණයෙන් ද බබළන රූකඩින් ද, නියන්, කැති, පිහියා, කෙටේරි, සායම් ටින්, බුරුසු, සතුන්ගේ ඇට කටු, දත්, නිය, ඔළිඳ ඇට යන ආදියෙන් ද පිරි ඔහුගේ කම්මලෙහි ඇතුළු කාමරය වූ කලි නියම කටු ගෙයක් විය. ඉස්තෝප්පුවේ කොනක වූ වතුර සැළියක් ගත් ලිග්ගල් තුනකින් යුතු උදුනෙන් දුම් නොනගින්නේ දවල් දොළහේ සිට එක දෙක වන තෙක් පමණි. එතැන් සිට රෑ හත වන තුරු උදුනෙන් නගින ගින්න නො නිවේ. වතුර හැළිය උපකාර වූයේ ඔහුගේ රූකඩ කැපීමට නොව ඔහු රූකඩ කැපීමෙන් එකතු කරගත් සුළු මුදලට තවත් සත කිහිපයක් ලබාදීමෙන් ඔහුගේ ආදායම වැඩි කිරීමට ය.
>
> රූකඩ කපන්නාගේ ඉස්තෝප්පුව කෝපි කඩයකි.
>
> අපේ ගම
>
> මාර්ටින් වික්‍රමසිංහ

1. රූකඩ කපන්නාගේ කම්මලෙහි ඇතුළු කාමරය කටු ගෙයක ස්වරූපය ගෙන ඇත්තේ කුමක් නිසා ද ?

.....................................................................................................................................

2. උදුනෙන් දුම් නොනගින්නේ කුමන වේලාවට ද ?

.....................................................................................................................................

3. සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

1. රූකඩ කපන්නාගේ කම්මල . . . . . . . . . . . . . . . . . .
   (උළු සෙවෙණි කළ නිවසකි/අතු සෙවෙණි කළ පැල්පතකි/ පිදුරු සෙවෙණි කළ පැල්පතකි)
2. රූකඩ කපන්නාගේ නිවසේ ඇතුළු කාමරය . . . . . . . . . . . . .
   (සිරගෙයක් බඳු ය/කටුගෙයක් බඳු ය/බිම්ගෙයක් බඳු ය)
3. ඉස්තෝප්පුවේ කොනක වූයේ . . . . . . . . . . .
   (කොස්සකි/මල් පෝච්චියකි/උදුනකි)
4. රූකඩ කපන්නාගේ ඉස්තෝප්පුව . . . . . . . . . . .
   (කම්මලකි/පැල්පතකි/කෝපි කඩයකි)
5. රූකඩ කපන්නාට ආදායම් ලැබෙන ක්‍රම . . . . . . . . . . .
   (එකකි/දෙකකි/තුනකි)

පාසලටත් අපේ ගෙදරටත් අතර එක් තැනක පාළු අම්බලමක් වෙයි. ළමයි, තාප්පයකින් වට වුණු ඒ ඉඩමේ පොල් ගස් හතරේ හටගන්නා කුරුම්බා කඩාගෙන කති. අම්බලම වත්තේ කුරුම්බා කඩාගෙන කන ළමයින්ගේ නායකයා ජින්නා ය. ඊළඟ නායකයා මම ය. ජිනපාල ගසට නැඟ කුරුම්බා කඩා බිම දමන විට, ඒ කුරුම්බා අවුලා ගෙනැවිත් ළමයින්ට බෙදා දෙන්නේ මා විසිනි. පාසලෙහි සිට ගෙදර ආ විගස පොත් හා ගල්ලෑලිත් මේසයක් උඩ හෝ ඇඳක් උඩ හෝ දමා මා දුවන්නේ තවත් ළමයින් තුන් හතර දෙනකු සමඟ කෙළිසෙල්ලම් කරනු පිණිස ය. ජිනපාල ද මා සමඟ එයි. ඔහු මා පාසලෙන් එන තෙක් මඟ බලා සිටින්නේ ද මා සමඟ සෙල්ලමට දුවනු පිණිස ය.

මඩොල් දූව

මාර්ටින් වික්‍රමසිංහ

1. පාසලත් ගෙදරත් අතර තිබෙන්නේ කුමක් ද ?

.....................................................................................................................................

2. කුරුම්බා කඩාගෙන කන ළමයින්ගේ නායකයා කවරෙක් ද ?

.....................................................................................................................................

3. පාසල් ගොස් පැමිණි පසු ළමයින් එක් වී කරන්නේ කුමක් ද ?

.....................................................................................................................................

4. ඡේදයට අදාළ වාක්‍ය පමණක් තෝරා යටින් ඉරක් අඳින්න.

01. පාසලටත්, අපේ ගෙදරටත් අතර පාළු ගෙයක් වෙයි.
02. අම්බලම් වත්තේ පොල් ගස් හයකි.
03. පාසලටත්, අපේ ගෙදරටත් අතර පාළු අම්බලමක් වෙයි.
04. පොල් කඩාගෙන යන ළමයින්ගේ නායකයා ජින්නා ය.
05. කුරුම්බා කඩාගෙන යන ළමයින්ගේ නායකයා ජින්නා ය.
06. අම්බලම් වත්තේ පොල් ගස් හතරකි.
07. උපාලි ගසට නැග කුරුම්බා කඩයි.
08. ජිනපාල ගසට නැග කුරුම්බා කඩයි.
09. ගෙදර ආ විගස ඇඳුම් දමන්නේ මේසයක් හෝ ඇඳක් උඩයි.
10. ගෙදර ආ විගස පොත් හා ගල්ලෑලිත් දමන්නේ මේසයක් හෝ ඇඳක් උඩ ය.

## සරල ගීතයකට සවන් දී ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.

- ගීත හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

කොටු වැටිච්ච පුංචි සරම - ඇඳන් නටන මල්ලියා
ගෙදර නිතර දබර කරන - පුංචි මල්ලියා
මගේ මල්ලියා - සුරතලා චණ්ඩියා //

සෙල්ලම් ගෙයක් මා විනෝදයෙන් සදයි
ඒවා කඩා පෙරළලා දමා දුවයි
සීනි බෝල කන්න සල්ලි ඉල්ලලා හඩයි
වසයි හරි දඟයි මල්ලියා හරි හොඳයි //

කොටු වැටිච්ච . . .

පාසල් ගොසින් බෑගයක් අතින් අරන්
ගල් කුරයක් අරන් ඇවිත් ළඟින් ඉඳන්
පුංචි ගීත පුංචි කමට කියයි ආදරෙන්
නටයි සන්තොසින් මල්ලියා රත්තරන්

කොටු වැටිච්ච . . . පද රචනය - කරුණාරත්න අබේසේකර
ගායනය - ශිරෝමාලා ප්‍රනාන්දු

1. මල්ලී ඇඳගෙන සිටින්නේ කුමක් ද ?

.............................................................................................................................................

2. සෙල්ලම් ගෙයක් සෑදූ විට මල්ලී කරන්නේ කුමක් ද ?

.............................................................................................................................................

3. මල්ලී සල්ලි ඉල්ලන්නේ කුමකට ද ?

.............................................................................................................................................

4. පුංචි ගීත ගයමින් මල්ලී කරන්නේ කුමක් ද ?

.............................................................................................................................................

5. පහත වාක්‍ය කියවා හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

1. මල්ලී ඉරි වැටුණු සරමක් ඇඳගෙන නටයි. ( )
2. මල්ලී ගෙදර නිතර ම දඟර කරයි. ( )
3. පලතුරු කෑමට මල්ලී සල්ලි ඉල්ලයි. ( )
4. පැන්සලක් අරන් ඇවිත් මල්ලී ඉඳගනියි. ( )
5. මල්ලී දඟ වුණත් හරි ම හොඳයි. ( )

**ගීතය**

ටක් ගානව - ටික් ගානව
ටිකක් කනව - දොර වහනවා
හුනු කිල්ලොටයක් අරගෙන - සීයා බුලත් විට හපනවා
අනේ සීයෙ අමල් බිසෝ - කතන්දරේ කියන්නකෝ . . . //

ජැන්ඩි පහට සරම ඇඳලා - ඉණ වට හවඩියක් බැඳලා
පුංචි අපට ආස හිතෙන - ඉස්සර රජ කතා කියලා
ගෙයි පිල උඩ පැදුර එළන් - සීයා හරි සැපට නිදන්

ටක් ගානව - ටික් ගානව . . .

පෝය දාට සිල් අරගෙන - තිස්සෙ ම බණ පද අහන්න
රෑට රෑට දොම් දොම්කිට - පුංචි රබන් පද කියන්න
ගෙයි පිල උඩ පැදුර එළන් - සීයා හරි සැපට නිදන්

ටක් ගානව - ටික් ගානව . . .

පද රචනය - ලයනල් සිල්වා
ගායනය - පේෂලා මෙන්ඩිස්

1. සීයාගෙන් ඇසීමට බලාපොරොත්තු වන කතාවේ නම කුමක් ද ?

.......................................................................................................................................................................

2. සීයාගේ ඉණ වටා බැඳ තිබෙන්නේ කුමක් ද ?

.......................................................................................................................................................................

3. කතා පැවසීමට සීයා වාඩි වෙන්නේ කොහේ ද ?

.......................................................................................................................................................................

4. සීයා පෝයදාට කරන්නේ කුමක් ද ?

.......................................................................................................................................................................

5. වරහන් තුළ ඇති වචනය තෝරා හිස්තැනෙහි ලියා වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. සීයා හුනු කිල්ලොටය අරගෙන ............................................ හපයි. (පුවක් ගෙඩිය/බුලත් විට)
2. සීයා ඉණ වට ............................................ බඳියි. (පටියක්/හවඩියක්)
3. සීයා පෝයදාට ............................................ (සිල් ගනියි/අඹ කඩයි)
4. ගෙයි පිල උඩ සීයා එළන්නේ ............................................ (රෙද්දකි/පැදුරකි)
5. සීයාට ළමයි ............................................ (ආදරෙයි/අකැමැතියි)

6. ගීතය රචනා කර ඇත්තේ කවුරුන් ද ?

.......................................................................................................................................................................

7. ගීතය ගායනා කරන්නේ කවුරුන් ද ?

.......................................................................................................................................................................

## <u>අසා ලිවීම</u>

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................